# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අල්මනාර් විදුහල (සංස්ථාගත කිරීමේ)

**අල්මනාර් විදුහල සංස්ථාගත කිරීම සඳහා වූ පනත්**
**කෙටුම්පතකි.**

---

වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ. කාදර් මස්තාන් මහතා විසින්
2015 දෙසැම්බර් මස 02 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[33 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

2–PL009494–225 (2015/12)

## අල්මනාර් විදුහල (සංස්ථාගත කිරීමේ)

**අල්මනාර් විදුහල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

*පූර්විකාව.*

"අල්මනාර් විදුහල යනුවෙන් සඳහන් කරනු ලබන විදුහලක් එකී විදුහලේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ විදුහලේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදුවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් නව කාත්තාන්කුඩි - 03 යන ලිපිනයෙහි පිහිටුවා තිබූ හෙයින් ද:

එකී විදුහල පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී විදුහල විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී විදුහල සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2015 අංක  දරන අල්මනාර් විදුහල (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*අල්මනාර් විදුහල සංස්ථාගත කිරීම.*

2. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු "විදුහල" යනුවෙන් සඳහන් කරනු ලබන) අල්මනාර් විදුහලේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන විදුහලට මින්මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "විදුහල" යනුවෙන් හඳුන්වනු ලබන අල්මනාර් විදුහල යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති විදුහලක් විය යුතු ය. තව ද, ඒ නාමයෙන් ඒ විදුහල විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඒ විදුහලට ඇත්තේ ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ.*

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ගේ ආගමික අධ්‍යාපන වුවමනා ඉටු කිරීම;

(ආ) ශිෂ්‍යයන් විසින් තෝරා ගන්නා ලද ඉස්ලාම් ධර්ම අධ්‍යාපනය විශේෂ අංශවලට විශිෂ්ට අභ්‍යාසය ලබා දීම;

(ඇ) පැහැදිලි ආගමික අධ්‍යාපන ලත් විශිෂ්ට, උගත් පිරිසක් ලෙස මෙම අධ්‍යාපන ආයතනයේ සිසුන් බිහි කිරීම;

2—PL 009322—300 (2015/11)

(ඈ) ඉස්ලාමීය අධ්‍යාපනය සහ සංස්කෘතියක් ඇති අළුත් පරම්පරාවක් ඇති කිරීම;

(ඉ) ඉස්ලාමීය උගත් සමාජයක් බිහි කිරීම සඳහා අත්තිවාරමක් දැමීම;

(ඊ) මුස්ලිම් සමාජය තුළ සහ මුස්ලිම් නොවන අය හමුවේත් ඉස්ලාම් ධර්මය ඉදිරිපත් කිරීමට සුදුසු උපදේශකවරුන් බිහි කිරීම;

(උ) මුස්ලිම් සමාජය තුළ අරාබි භාෂාව ව්‍යාපත්ත කිරීම සහ එම භාෂාවෙන් උසස් අධ්‍යාපන ලබා ගැනීම සඳහා සුදුස්සන් බිහි කිරීම;

(ඌ) සුළු ජාතියක් වශයෙන් මුස්ලිම්වරු ජීවත්වන මෙම රටේ සුළු ජාතියට ආවේණික වූ පුද්ගලික ප්‍රශ්න හඳුනාගෙන, ඒ සඳහා වූ ඉස්ලාම් ධර්මයේ විසඳුම සපයන පර්යේෂකවරුන් බිහි කිරීම;

(එ) අනෙක් ආගම් පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගත හැකි උපදෙස් සැපයීම;

(ඒ) අවශ්‍ය වූ අනෙක් පාඨමාලා ඉගැන්වීම;

(ඔ) රටේ ක්‍රියාත්මක වන්නා වූ අනෙක් අධ්‍යාපන අංශවලට අදාළ රජයේ විභාගවලට පෙනී සිටීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සහ පුහුණු කිරීම;

(ඕ) තාක්ෂණික විෂයයන් ශිෂ්‍යයින්හට පුහුණු කිරීම;

(ක) හැකි වූ සියලු අංශවල අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ශිෂ්‍යයින්හට අවශ්‍ය කටයුතු කිරීම;

(ග) ශිෂ්‍යයන් නතර වී ඉගැන්වීම් කටයුතු කරගෙන යාම සඳහා හැකි නේවාසිකාගාර පහසුකම් ඇති කර දීම;

(ච) විද්‍යාලයේ අරමුණුවලට ගැළපෙන අනෙක් විදේශ රටවල ඇති අධ්‍යාපන ආයතනවල උපාධියෙන් පසු වූ තමන්ගේ උසස් අධ්‍යාපන කටයුතු නොකඩවා කරගෙන යාමට ශිෂ්‍යයින් සඳහා අවශ්‍ය කටයුතු කර දීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු අධ්‍යක්ෂ ජනරාල්, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන එකොළොස් දෙනකුට නොඅඩු වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකාර කමිටුවක් විසින් විදුහලේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) විදුහලේ ප්‍රථම කළමනාකරණ කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී විදුහලේ කළමනාකාර කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ ද තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, විදුහලේ මුදල් ආයෝජනය කිරීමේ ද, විදුහලේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, විදුහලේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට අනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) සංස්ථාවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය ද, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා අවශ්‍ය කරන සුදුසුකම්;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන යම් කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන්ම සහ එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

විදුහල විසින් ගෙවිය යුතු සහ විදුහලට අයවිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී පැවති විදුහල විසින් ගෙවිය යුතුව තිබූ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට විදුහලට අයවිය යුතුව තිබූ සියලු ණය සහ ලැබිය යුතුව තිබූ සම්මාදම් මුදල්, ප්‍රදාන සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහෙම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ ඒ වෙනුවෙන් හරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ විදුහල සතු බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී, කරගෙන යාමේ දී සංස්ථාව විසින් වියදම් කරන ලද සියලුම මුදල් අරමුදලින් ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ විදුහල වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල

දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තව ද, විදුහලේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද විදුහල සතු වන්නේ ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් විදුහලට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්ම වන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියළු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**12.** සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සෑම වර්ෂයකම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, සංස්ථාව විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු විය යුතු විගණකවරයෙක් හෝ විගණකවරයන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනෙක් ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන්

එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින් ඔවුන් යටතේ හිමිකම්පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.